වර්ෂය තුල දී ධීවර සංස්ථාවේ ප්‍රතිපත්තිය පෞද්ගලික අංශයෙන් වැඩිපුර මාළු මිල දී ගැනීම කෙරෙහි යොමු විය. ඒ අනුව සංස්ථාව පෞද්ගලික අංශයෙන් මාළු ටොන් 4,203 ක් මිල දී ගත් අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 74 ක වැඩිවීමකි. මිලදී ගැනීමෙහි මෙම වැඩිවීම, පෞද්ගලික අංශයෙහි නිෂ්පාදනය වැඩිවීමද පිළිබිඹු කළේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 1978 කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්‍ෂ 212 ක් යයි ගණන් බලා ඇත. මෙය 1977 නිෂ්පාදන මට්ටම වූ ලීටර් දශ ලක්‍ෂ 214 සිට පහත වැටීමක් පිලිබිඹු කරයි. ජාතික කිරි මණ්ඩලයට එකතු කිරීමට හැකි වූයේ ලීටර් දශ ලක්‍ෂ 49 ක් හෙවත් වර්ෂයේ මුලු නිපැයුම්වලින් සියයට 23 ක් පමණකි. ඉකුත් වර්ෂයේදී මණ්ඩලය කිරි ලීටර් දශ ලක්‍ෂ 55ක් හෙවත් සියයට 25 ක් එකතු කළේය. නිෂ්පාදනයෙහි මෙන්ම එකතු කිරීමේ පහත වැටීම ද ප්‍රධාන වශයෙන්ම සත්වාහාර වල අධික මිල නිසා නිෂ්පාදක ආන්තිකයන් පහල මට්ටමක පැවතීම තුලින් පැහැදිලි කළ හැකිය. ඇතැම් විට, ගව මස් මිල අධික වීම නිසා සතුන් වැඩිපුර ඝාතනය කිරීමද කිරි නිෂ්පාදනය කෙරෙහි ද හිතකර බලපෑමක් කරන්නට ඇත. තෙල් සහ මේද සංස්ථාව විසින් සත්වාහාර මිල සියයට 20 කින් පමණ අඩු කිරීම ද, කිරි මණ්ඩලය විසින් 1978 නොවැම්බර් මාසයේ දී කිරි මිල දී ගැනීමේ මිල සියයට 38 කින් පමණ වැඩි කිරීමද නිසා 1978 මෙම පහත වැටීමේ ප්‍රවණතාව 1979 දී ආපසු හැරීමට ඉඩ ඇත.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් ගණන් බලා ඇති පරිදි බිත්තර නිෂ්පාදනය 1977 දී වූ බිත්තර දශ ලක්‍ෂ 380 සිට 1978 දී දශ ලක්‍ෂ 360 දක්වා සියයට 5 කින් පහත වැටී ඇත. පසුගිය වසරේ මෙන්ම, ප්‍රධාන වශයෙන් අධික සත්වාහාර මිල නිසා නිෂ්පාදකයාගේ ලාභ පහල මට්ටමක වීම නිෂ්පාදනයෙහි මෙම අඩුවීමට හේතු විය.

## කර්මාන්ත

ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන වටිනාකම (ප්‍රධාන සම්ප්‍රදායික කෘෂි අපනයන වන, තේ, රබර් සහ පොල් ආශ්‍රිත අපනයන සැකසුම් කර්මාන්ත හැර)1977 දී රුපියල් දශලක්‍ෂ 7004 සිට 1978 දී රුපියල් දශලක්‍ෂ 8851 දක්වා වැඩිවූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙය ගතවූ වර්ෂයේ පෙන්නුම් කළ සියයට 16 ක වැඩිවීම හා සැසඳූ කල සියයට 26 ක වැඩිවීමක් පිළිබිඹු කරයි.[1] මිල මට්ටමෙහි වෙනස්වීම් මකාලනු වස්, තොග අලෙවි මිල දර්ශකයෙන් ගැළපූ කල 1978 මූර්ත කාර්මික වර්ධන අනුපාතිකය සියයට 11 ක්වූ බවට ඇස්තමේන්තු කළ හැකිය. 1977 හා 1976 යන වර්ෂ දෙකේදීම සියයට එකක් බැගින් වූ වර්ධන අනුපාතික සමග මෙය සැසඳේ.

1977 ආර්ථික ප්‍රතිපත්ති නව මඟකට යොමුවීමෙන් පසුව පාලන විලංගුවලින් මුදහැරි දේශීය කර්මාන්ත ඊට නිතැතින්ම දක්වූ ප්‍රතිචාරයක් ලෙස 1978 දී කැපී පෙනන හා පෙරනොවූ විරූ අන්දමින් කර්මාන්ත අංශයේ සිදුවූ මෙම ක්‍ෂණික ප්‍රගතිය විස්තරකළ හැකිය. ආනයන ලිහිල් කිරීම නිසා අමු ද්‍රව්‍ය සහ අමතර කොටස් පහසුවෙන් ලබාගත හැකිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තොග රැස්කිරීම අඩුකිරීමටත්, ධාරිතා උපයෝගීකරණය වැඩි කිරීමටත් පුළුවන් විය. සීමිත ආනයන තරඟය නිසා තරඟකාරී පරිසරයක භාණ්ඩ තත්ත්වය උසස් කිරීම අවශ්‍ය විය. සෑහෙන ආනයන ආරක්‍ෂණයක් යටතේ වුවද,තරඟ කිරීමට නොහැකි තරම් අකාර්යක්‍ෂමවූ ඇතැම් කර්මාන්ත කොන්වූ බවක් පෙනුනද, එබඳු කර්මාන්ත අධික සමාජ-ආර්ථික වියදමක් යටතේ සදාකාලයටම ආරක්‍ෂා කළයුතුද යන්න විමසා බැලිම වටී. වැඩියෙන් රැකියා සැපයීම අරමුණු කොටගත් අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත තත්ත්වයෙන් හා තරඟකාරිත්වයෙන් උසස් රෙදිපිළි ආනයන කෙරෙන් එල්ල වූ තීරණාත්මක අභියෝගයට මුහුණ දුන් නමුත්, මෙය ප්‍රධාන වශයෙන්ම උද්ගතවූයේ ආරක්‍ෂණ තිරුබදු පරිපාලනමය වශයෙන් ඉවතලා දේශීය වෙළෙඳ පලට හොඳ රෙදිපිළි ලාභයට සැපයීමටගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙනි. පාරිභෝගිකයා පිට බර පටවමින් අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ රැකිරක්‍ෂා සැපයීමට දිගටම සහනාධාර දීම දීර්ඝ කාලීන වශයෙන් අකාර්යක්‍ෂමතාව ඇති කරමින් නිෂ්පාදන ඵලදාව අඩුකර ලන්නක් බව පෙනේ. ජාත්‍යන්තර වෙළඳ පලට නිපදවීම සඳහා ශිල්ප ක්‍රම සහ තත්ත්වය උසස් කිරීම ඊට වඩා යෝග්‍ය විය හැකිය.

---

1. ගතවූ වර්ෂ වල මෙන් මෙම දත්තයනට පදනම් වූයේ දේශීය කර්මාන්ත වලින් ප්‍රධාන කොටස ලෙස ගැනෙන කර්මාන්ත ආයතන 1500 ක් පමණ අරභයා මහ බැංකුව විසින් කරනු ලබන සමීක්ෂණයයි. විස්තර ලඟදී නිකුත්වන ආර්ථික විවරණයෙහි දක්වෙනු ඇත.

රාජ්‍ය සහ පෞද්ගලික යන කර්මාන්ත අංශ දෙකම 1978 දී සැහෙන වර්ධනයක් පෙන්විය. වර්තන අගය අනුව පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනය සියයට 30 කින් ව්‍යාප්තවූ අතර, රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය සියයට 26 කින් වැඩිවිය. ගතවූ වර්‍ෂයේ සියයට 61 ක් පමණ වූ ධාරිතා උපයෝගීකරණය 1978 දී සියයට 70 තෙක් ඉහළ ගියේය. කර්මාන්ත අංශයේ සේවක සංඛ්‍යාව සියයට 15 කින් වැඩිවිය. පෞද්ගලික අංශයේ සේවක සංඛ්‍යාව සියයට 17 කින්ද, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සියයට 13 කින් ද වැඩිවිය. ආනයන අමුද්‍රව්‍ය භාවිතය 1977 සියයට 66 සිට 1978 දී සියයට 79 දක්වා වැඩිවිය. මෙය අමුද්‍රව්‍ය බහුතර ප්‍රමාණයක් ආනයන බලපත්‍රවලින් මුදහැරීම නිසා ඇතිවූ නියත කෙටි කාලීන ප්‍රතිඵලයකි. මෙයින් පසු ආනයන අමුද්‍රව්‍ය සඳහා දේශීය අමුද්‍රව්‍ය ආදේශන දිරි ගැන්වීම සඳහා ප්‍රමාණාත්මක සීමා කිරීම වෙනුවට සාපේක්‍ෂ වාසි ඇති සැම තැන්හිම ආනයන තීරු බදු උපයෝගි කරගැනීමට සිදුවනු ඇත.

කර්මාන්ත අමාත්‍යාංශයට අනුව කාර්මික අපනයන (ඛනිජ තෙල් ඇතුළුව, මැණික් හැර) වර්තන මිල අනුව 1978 දී රුපියල් දශලක්‍ෂ 1963 දක්වා දෙගුණ විය. එහෙත් විනිමය අනුපාතික වෙනස්වීම් අනුව ගැළපූ කල මෙම වැඩිවීම සියයට 5 ක් පමණ විය. පිහන් භාණ්ඩ, රෙදිපිළි, අත්කම් භාණ්ඩ සහ ආහාරද්‍රව්‍ය අපනයනයන්හි ප්‍රධාන වැඩිවීම් දක්නට තිබුණි කාර්මික නිෂ්පාදනයෙන් පහෙන් පංගුවක් පමණ අපනයන කරනු ලැබීම ද සටහන් කිරීම වටී.

1978 වර්ෂයේ විවිධ කර්මාන්ත අංශවල වර්ධන රටාවෙහි සැහෙන වෙනස්වීමක් පෙන්නුම් කළේය. පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් තත්ත්වය තවදුරටත් පැහැදිලි වේ.

**1·6 වැනි සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදනයේ වටිනාකම 1976 – 1978**

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රු: දශ ලක්ෂ) | | |
|---|---|---|---|
| | 1976 | 1977 | 1978 |
| 1· ආහාර පාන වර්‍ග හා දුම්කොළ .. .. | 1,715 | 2,294 | 2,609 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම්භාණ්ඩ .. | 680 | 698 | 1,008 |
| 3· දැව සහ දැව භාණ්ඩ (ගෘහභාණ්ඩ ඇතුලුව) .. | 129 | 127 | 124 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. | 203 | 270 | 376 |
| 5· රසායන ද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 2,336 | 2,469 | 3,279 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ .. .. | 360 | 411 | 592 |
| 7· මූලික ලෝහ නිෂ්පාදන .. .. | 138 | 132 | 219 |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. .. | 474 | 571 | 590 |
| 9· අනිකුත් .. .. | 26 | 34 | 55 |
| එකතුව .. .. | 6,061 | 7,004 | 8,851 |
| මූර්ත වර්ධන අනුපාතිකය (%).. .. | 1·2 | 1·3 | 10·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්තන වටිනාකම අනුව, 1978 වර්ධනය වූ ප්‍රධාන කර්මාන්ත අංශ නම්, මූලික ලෝහ නිෂ්පාදනයන්, (සියයට 66), රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම්භාණ්ඩ (සියයට 44), ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදන, (සියයට 44) කඩදසි, (සියයට 39) සහ රසායනික ද්‍රව්‍ය (සියයට 33)ය. මීට වෙනස්ව පසුගිය වර්‍ෂයේ වර්ධන අංශයන් වූයේ ආහාරපාන, කඩදසි සහ සකස් කළ ලෝහභාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණයන්ය. ආහාරපාන නිෂ්පාදන කර්මාන්තයේ වර්ධන වේගය අඩුවීමට සැපයීම් ප්‍රශ්න (උදා: මස්, කිරි, හකුරු යනාදිය) සහ ආනයන තරඟය ද හේතු වූ බව පැහැදිලිය. සකස් කළ ලෝහභාණ්ඩ හා යන්ත්‍රෝපකරණ අංශයෙහි කර්මාන්ත (උදා: හැඳි, ගෑරුප්පු සහ මුළුතැන්ගෙයි උපකරණ, රථවාහන අමතර කොටස්, ඉන්ජිනේරු උපකරණ යනාදිය) ප්‍රධාන වශයෙන් ආනයන තරඟය අභිමුඛයෙහි පසු බැස ඇති බව පෙනේ.

මූර්ත වර්ධන අනුපාතිකයන් දැන ගැනීම සඳහා ඉහත දක්වන ලද අංශයන්හි වර්තන වටිනාකම්වල වර්ධන අනුපාතික, මිල වෙනස්වීම් සඳහා ගැළපිය යුතුය. මෙම ගැළපීම සඳහා විශ්වාසයෙන් යුතුව යෙදිය හැකි දර්ශකයක් නොමැති නිසා තොග මිල දර්ශකයෙහි භාණ්ඩ – උප දර්ශකයන් යොදගැනේ. මේ ආකාරයෙන් ගැලපීම් කළවිට පෙනී යන පරිදි මූලික ලෝහ නිෂ්පාදන අංශය සියයට 43 කින්ද, රසායනික ද්‍රව්‍ය සියයට 29 කින් ද, කඩදාසි සියයට 10 කින්ද, රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් සියයට 3 කින්ද වර්ධනය විය. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදන අංශය පිළිබඳ භාවිතයට ගත හැකි දර්ශකයක් නොමැත්තෙන් සිමෙන්ති මිල වෙනස්වීම අනුව ගැළපූ විට (මෙම අංශයේ නිෂ්පාදනයෙන් තුනෙන් එකකට වැඩියෙන් සිමෙන්තිය.) එම අංශයේ මූර්ත වර්ධනය සියයට 22 ක් පමණ වේ.

මූලික ලෝහ නිෂ්පාදන අංශයේ වර්ධනය සහමුලින්ම පාහේ වානේ සංස්ථාවෙහි නිෂ්පා- දනය වැඩිවීම නිසාය. ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදන අංශයෙහි ව්‍යාප්තියට වැඩි වශයෙන්ම හේතු වූයේ සිමෙන්ති, උළු සහ ගඩොල් නිෂ්පාදනය සීඝ්‍රයෙන් ඉහළ යාමයි. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන අංශයෙහි වැඩිවීම සිදුවූයේ ඛනිජ තෙල්, ටයර් සහ රබර් කර්මාන්තයන්හිය. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදන ගණයෙහි වර්ධනය, කඩදාසි සංස්ථාවෙහි නිපැයුම වැඩිවීමත් ආනයන ලිහිල් කිරීමෙන් පසු කඩදාසි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තවල ඇතිවූ පුනර්ජීවනයත් නිසාය. රෙදි පිළි, ඇඳුම් පැළඳුම්, සම්භාණ්ඩ නිෂ්පාදන ක්ෂෙත්‍රයෙහි මහා පරිමාණ නිෂ්පාදන ඒකකවල නිපැයුම වැඩිවීම සුළු පරිමාණ කර්මාන්ත නිපැයුමෙහි පහත වැටීම මුළුමනින්ම පාහේ සමහන් කරලූ බව ද පෙනී යයි.

නොකඩවා දෙවැනි වර්ෂයටත්, දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය පහත වැටීම විමසිල්ලට භාජනය විය යුතු කරුණක් විය. මෙම අංශයෙහි ප්‍රධානීන් වන රාජ්‍ය දැව සංස්ථාවෙහි සහ ලංකා තුනී ලැලි සංයුක්ත මණ්ඩලයෙහි නිෂ්පාදනය අඩුවීමක් පෙන්විය.

පසුගිය වසරෙහි වාර්ෂික වාර්තාවෙහි සඳහන් කළ පරිදි, 1977 ආර්ථික සංශෝධන මගින් අධික ආරක්ෂිත තීරු ගාස්තු කඩතුරාව යටතේ කරනු ලබන ආනයන ආදේශනය වෙනුවට අපනයන නැඹුරුවකින් යුතු සංවර්ධනයක් කෙරෙහි කාර්මික ක්ෂෙත්‍රයේ අවධානය වෙනස් කරවන ලකුණු හැඟවීය. නව උපාය මාර්ගයෙහි ප්‍රධාන අංශයක් වූයේ මහ කොළඹ ආර්ථික කොමිසම (වා. ආ. කො.) යටතේ සතරැස් සැතපුම් 200 ක් පමණ භූමි භාගයක් තුල "අපනයන සැකසුම් කලාප" පිහිටුවීමය. දේශීය සහභාගිත්වයක් ඇතිව හෝ නැතිව අපනයන නැඹුරුවක් ඇති කර්මාන්ත මෙම කලාපවල පිහිටුවීම සඳහා විදේශීය ආයෝජකයන්ට ආරාධනා කැරුණි. අවුරුදු හතේ සිට දහය දක්වා වූ බදු සහන කාලයක් සහ ඉන්පසු සහනදායී පිරිවැටුම් බදු, ආනයන, අපනයන තීරු ගාස්තු හා වරාය ගාස්තු අය නො කිරීම, සීමිත එහෙත් වරණීය ලෙස දේශීය වෙළෙඳපලට පිවිසීමේ අයිතිය සහ විදේශීය ගණුදෙනු පිළිබඳ විනිමය පාලන ඉවත් කිරීම ආදී සිත් ඇද ගන්නා සුළු දිරි ගැන්වීම් රාශියක් ව්‍යාපාරික ආයතනවලට දෙනු ලැබිණ. මහ කොළඹ ආර්ථික කොමිසමෙහි බල ප්‍රදේශයෙන් පිටත විදේශීය ආයෝජන පිළිබඳ ප්‍රතිපත්- තිය විශේෂයෙන් තෝරාගත් කර්මාන්ත සඳහාවූ අතර, එබඳු ආයෝජන සාමාන්‍යයෙන් අපනයන නැඹුරුවක් ඇති කර්මාන්තවලට හෝ දේශීය .වශයෙන් ශිල්පීය ඌණතා ඇති ක්ෂේත්‍රවලට පමණක් සීමාවිය. විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.ක.) එබඳු ආයෝජන අධීක්ෂණය කළේය. රුපියල් 7,00,000 ට වැඩි ප්‍රාග්ධන උපකරණ ආනයනඅවශ්‍ය වන දේශීය කර්මාන්ත සඳහා බලපත්‍ර අවශ්‍යවූ අතර එම අනුමැතිය දෙනු ලැබුයේ දේශීය ආයෝජන උපදේශක කමිටුව (දේ.ආ ක.) විසිනි. අදාළ බලධාරීන් විසින් 1978 අනුමත කරන ලද කර්මාන්ත පිළිබඳ දත්තයන් පහත 1.7 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

## 1·7 වැනි සංඛ්‍යා සටහන

## අනුමත කළ කාර්මික ආයෝජන – 1978

| කාර්මික ගණය | ඒකක ගණන | | | විදේශීය ආයෝජන (රුපියල් දශලක්ෂ) | | | මුළු ආයෝජන (රුපියල් දශලක්ෂ) | | | රැකිරක්ෂා සැපයීම ( ගණන) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ම. ආ.කො. | වි.ආ.ක. | දේ.ආ.ක. | ම ආ.කො. | වි.ආ.ක. | දේ.ආ.ක. | ම. ආ.කො. | වි.ආ.ක. | දේ.ආ.ක | ම. ආ.කො. | වි.ආ.ක. | දේ.ආ.ක. |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ .. | — | — | 109 | — | — | 68 | — | — | 99 | — | — | 3,182 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ .. | 32 | 7 | 1,315 | 623 | 20 | 346 | 919 | 31 | 454 | 14,357 | 1,437 | 20,122 |
| 3· දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | — | — | } 184 | — | — | } 195 | — | — | } 200 | — | — | } 1,535 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. | 1 | — | | 6 | — | | 7 | — | | 222 | — | |
| 5· රසායනද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ .. | 7 | 11 | 347 | 47 | 24 | 133 | 75 | 36 | 179 | 9,681 | 528 | 7,092 |
| 6· ලෝහ නොවන ඛණිජ භාණ්ඩ (ඛණිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 2 | 1 | 126 | 497 | 9 | 16 | 583 | 21 | 21 | 832 | 78 | 2,262 |
| 7· මූලික ලෝහ නිෂ්පාදන .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 3 | 2 | 304 | 10 | 21 | 91 | 16 | 33 | 108 | 555 | 342 | 9,120 |
| 9· අනිකුත් .. | 7 | — | — | 19 | — | — | 25 | — | — | 848 | — | — |
| මුළු ගණන .. | 52 | 21 | 2,385 | 1,202 | 74 | 849 | 1,624 | 121 | 1,061 | 26,495 | 2,385 | 43,313 |

* යෝජනාක්‍රමවල විදේශීය පිරිවැය පමණි.

මූලයයන්: මහ කොළඹ ආර්ථික කොමිසම (ම.ආ.කො.)
විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.ක.)
දේශීය ආයෝජන උපදේශක කකමිටුව (දේ.ආ.ක.)

DISCARDED
UNIVERSITY OF MORATUWA, SRI LANKA
LIBRARY

මහ කොළඹ ආර්ථික කොමිසම (ම.ආ.කො.) කර්මාන්ත 52 ක් අනුමත කළ අතර එහි මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1624 ක් වේ. මෙයින් සියයට 74 ක් විදේශීය ආයෝජන වූ අතර, මුළු විදේශීය ආයෝජනයෙන් අඩක් පමණ වැයවෙන කර්මාන්ත 32 ක්ම රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් කර්මාන්ත අංශයේය. දියුණු රටවල ප්‍රධාන වෙළඳපොළවලට සිය අපනයන ව්‍යාප්ත කිරීමේදී ප්‍රමාණාත්මක හා අනෙකුත් සීමාවන්ට මුහුණ දී ඇති රටවලින් මෙම විදේශීය ආයෝජන මෙහි පිවිසි අතර ශ්‍රී ලංකාව ඔවුනට සවකීය අපනයන ව්‍යාප්ත කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුනි.

විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.ක.) කර්මාන්ත 21 ක් අනුමත කර ඇති අතර ඒවායේ මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 121 කි. මින් තුනෙක් දෙකක් විදේශීය ආයෝජන වේ. මුළු විදේශීය ආයෝජනයෙන් සියයට 32 ක් පමණ කෙරෙන කර්මාන්ත ආයතන 11 ක් ම රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශයෙහිය. විදේශීය ආයෝජනයෙන් තවත් සියයට 27 ක් පමණ කෙරෙන ආයතන 7 ක් රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් අංශයෙහිය. දේශීය ආයෝජන උපදේශක කමිටුව (දේ.ආ.ක.) විසින් අනුමත කළ කර්මාන්ත 2385 න් 1315 ක් නොහොත් සියයට 55 ක් පමණ වූයේ මුළුආයෝජනයෙන් සියයට 43 ක් පමණ වැයවන රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් අංශයෙහිය. රසායන ද්‍රව්‍ය, නිමකළ ලෝහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ අංශයන්හි කර්මාන්ත 651 අනුමත කළ අතර, මුළු ආයෝජනයෙන් සියයට 27 ක් පමණ එහි විය. සාමාන්‍යයෙන් මහ කොළඹ ආර්ථික කොමිසමෙන් පිටත අනුමත කළ ආයෝජනවලින් බොහොමයක්ම රෙදිපිළි, ඇඳුම් පැළඳුම් අංශයෙහි විය. විදේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්තවලින් බොහොමයක් අපනයන නැඹුරුවකින් යුක්තවූ මුත්, දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්ත බොහොමයක්ම දේශීය වෙළඳපල අරමුණු කරගත් ඒවා විය. දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්තවලින් යම් ප්‍රමාණයක් දියුණු ශිල්පක්‍රම භාවිතා වන රසායන ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර හා සූක්ෂම භාණ්ඩ නිෂ්පාදන අංශයන්හි විය.

කොළඹ නගරාසන්න ප්‍රදේශයෙහි කර්මාන්ත සංකේන්ද්‍රනයවීම කෙරේ බලධාරීන්ගේ අවධානය යොමු විය. මුළු කර්මාන්ත සංඛ්‍යාවෙන් සියයට 80 කටත් වඩා කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර මුළු නිපැයුමෙන් සියයට 90 ක් මෙම කර්මාන්තවල කෙරෙන අතර සේවක සංඛ්‍යාවෙන් සියයට 81 ක් එහි වන බවත් සමීක්ෂණයකින් හෙළි වී ඇත. ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත වඩාත් සමබරව ව්‍යාප්ත කිරීම සඳහා බදු සහ වෙනත් පහසු-කම් කිහිපයක්ම ප්‍රදනය කිරීම කෙරෙහි අවධානය යොමුවෙමින් පවතී. එහෙත් නූතන කර්මාන්ත බොහොමයක් තැනින් තැන ගෙන යාමට ඇති පහසුව නිසා ස්ථාන ගතවීමේ දී නම්‍යතාවයක් පෙන්වයි. එබඳු කර්මාන්තවලට මෙවැනි පහසුකම් බලපානු ඇත්තේ අල්ප වශයෙනි. එම නිසා කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කරලීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ආයෝජන කිරීම ආකර්ෂණීය වන සේ අවශ්‍ය ව්‍යුහමය පහසුකම් සහිත ප්‍රාදේශීය කාර්මික මධ්‍යස්ථාන පිහිටුවීම යෝග්‍ය වනු ඇත.

## මිල

ශ්‍රී ලංකා ආර්ථිකයේ මිල මට්ටමේ සිදුවන වෙනස්වීම් පෙන්නුම් කිරීම සඳහා ප්‍රසිද්ධ කරන ලද දර්ශකයන් වශයෙන් ඇත්තේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිළියෙල කරන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයත්, මහබැංකුව මගින් සකස් කරනු ලබන තොග මිල දර්ශකයත් පමණි. මින් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සිල්ලර මිල ගණන්වල වෙනස්වීම් දක්වන අතර, එය 1978 දී සියයට 12·1 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වර්ෂ දෙකෙහි මෙහි වැඩිවීම සියයට 1·2 ක් විය. මෙම දර්ශකයේ ඇති ඌණතාවන් පසුගිය වර්ෂවල ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවන්හි දක්වා ඇත. අනෙක් අතට තොග මිල දර්ශකය[1] 1977 පෙන්නුම් කරන ලද සියයට 20·8[2] ක වැඩිවීම හා සසඳන විට

---

1. භාණ්ඩයක අලෙවි ක්‍රියාවලියේ ප්‍රථම වාණිජ හුවමාරු අවස්ථාව ප්‍රාථමික වෙළඳ හුවමාරු අවස්ථාව වශයෙන් සලකනු ලැබේ. මේ නිසා දේශීය නිෂ්පාදිතයන්හි නිෂ්පාදකයන්ගේ මිල ගණන් සහ ආනයනය කළ භාණ්ඩයන් හි ආනයන මිළ ගණන් තොග මිළ යනුවෙන් අදහස් කෙරේ. මෙලෙස සාමාන්‍ය ව්‍යවහාරයේදී තොග මිළ යනුවෙන් අදහස් කරන දෙයට වඩා මෙය වෙනස් බව සඳහන් කළ යුතුය.

2. සංශෝධිත දර්ශකය අනුව.